VERITÉ RESEARCH
Strategic Analysis for Asia

NO.5A, POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA
TEL & FAX: + 94 11 2055544
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG

**මාධ්‍ය නිවේදනය – 2023 මාර්තු 23**

## රට දැඩි අර්බුදකාරී තත්ත්වයක සිටියත් වෙනස් වීමේ වුවමනාවක් ආණ්ඩුවට නැහැ ආණ්ඩුවේ වගවීම සහ විනිවිදභාවය දැඩි අනතුරුදායක මට්ටමක

වෙරිටේ රිසර්ච් ආයතනය, 2022 වසරේ යෝජනා කළ ප්‍රතිපත්ති ප්‍රකාරව රජය කටයුතු කර ඇති ද, යන්න විමසුමට ලක්කර ඇත. ඒ යටතේ, රජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කළ කැබිනට් තීරණ සහ යෝජනා 15ක් සැළකිල්ලට ගෙන තිබෙණ අතර, ඒවා 1. සෞඛ්‍ය සහ ඖෂධ 2. ආහාර සහ කෘෂිකර්මය හා 3. ඉන්ධන සහ බලශක්තිය යන ක්ෂේත්‍රවලට අයත් වන අතර ඒවා,. 2022 වසරේ දී, ජනතාවට වඩාත් අදාළ වූ මෙන්ම, ජනතාව විශාල වශයෙන් ගැටළුවලට මුහුණුදුන් ක්ෂේත්‍ර 3ක් වේ.

ආණ්ඩුව රටේ බදු ගෙවන ජනතාවගේ මුදල් අපහරණය කරන්නේය යන අදහස පොදුවේ ජනතාව අතර පැතිර පවතින නිසා රටේ ආදායම් බදු ප්‍රතිපත්තියට මෑතක දී, හඳුන්වාදුන් සංශෝධනයන් ඉතා දැඩි විවේචනයන්ට ලක්වෙමින් තිබේ. යෝජිත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන ප්‍රගතියට අදාළ තොරතුරු ප්‍රසිද්ධ කිරීම ආණ්ඩුව ප්‍රතික්ෂේප කිරීම, මෙම අදහස තවදුරටත් රටේ ජනතාව අතර මුල්බැස ගැනීමට හේතු වී ඇත. එම තොරතුරු සගවාගෙන සිටීම, ජනතා මුදල්වලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මන්දගාමීව සිදුවීමට මෙන්ම එම මුදල් අවභාවිතා කිරීමට ඇති අවදානම ඉහළ යෑමටත් තුඩු දිය හැකිය.

### ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළබඳ තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට ඇති අකමැත්ත

2022 සැප්තැම්බර් මාසයේ දී, ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතා රජයේ සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට දැනුම්දීමක් සිදුකළේය. ඔවුන්ගේ පරම වගකීම වන්නේ පොදු ජනතාවගේ පහසුව තකා කටයුතු කිරීම බවත්, ඒ වෙනුවෙන් කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීමේ පද්දතීන් සියලුම රජයේ අමාතයංශ සහ ආයතනවල පිහිටුවීම අනිවාර්යය වන බවත් ඔහු කීවේය. එහෙත් අප කළ පර්යේෂණයෙන් හෙළි වුයේ, රාජ්‍ය අමාත්‍යාංශ සහ ආයතන, රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළබඳ යොමු කළ තොරතුරු ඉල්ලුම්පත් වලට කාර්යක්ෂමව ප්‍රතිචාර නොදක්වන බවයි.

අප ආයතනය තෝරාගත් යෝජනා 15 ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබුනේ ආයතන 9කට ය. වෙරිටේ රිසර්ච් සොයාගැනීම්වලට අනුව,

- යෝජනාවල ප්‍රගතිය ප්‍රගාමීව, මාර්ගගතව අනාවරණය කිරීමට කිසිම ආයතනයක් කටයුතු කර නැත (මෙසේ ප්‍රතික්ෂේප කරන්නේ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පණතේ 8(2)(b)(v) වගන්තිය යටතේ සදහන් මාර්ගෝපදේශයන්ට අනුගත වන්නේ නම් එම තොරතුරු ප්‍රගාමීව ප්‍රසිද්ධ කළ යුතුව ඇත යන්න නීතියෙන්ම නියම කර ඇති පසුබිමකය)
- තොරතුරු දැනගැනීමේ පණත යටතේ කළ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වූයේ ආයතන 3ක් පමණි
- යෝජනාවල ප්‍රගතිය ඇගයීමට යොදාගත හැකිවූයේ එක් ආයතනයක් ලබාදුන් තොරතුරු පමණි

### වගකිව යුත්තේ කවුරුන් ද? වගවීමක් නොමැතිවීම ප්‍රධාන ගැටළුවකි

කැබිනට් තීරණයේ හෝ යෝජනාවේ අන්තර්ගතය තුල එම තීරණය හෝ යෝජනාව ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින ආයතන හඳුනාගත හැක. නමුත් එසේ කිරීමේ වගකීම තමන් සතු බවට පැහැදිලි අවබෝධයක් ආණ්ඩුවේ බොහෝ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට නොමැති බව මෙම ඇගයීමේ දී, අනාවරණය විය.

මෙනිසා, තොරතුරු ඉල්ලා ඉදිරිපත් කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් විවිධ ආයතනවල තොරතුරු දැනගැනීමේ නිලධාරීන් අතර හුවමාරු වූ අවස්ථා ගණනාවක් තිබුණි.

ශ්‍රී ලංකාව වර්තමානයේ ගෙවමින් සිටින දැඩි අර්බුදකාරී තත්ත්වය මධ්‍යයේ වුව, ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ වගවීම් විරහිත ස්වභාවය තවමත් එළෙසම බව පෙනෙන්නට ඇත. ආණ්ඩුවේ කටයුතුවල වගවීම සහ විනිවිදභාවය ඉහළ දමාගත යුතුය යන්න මෑත සමයේ රටේ සිදුවූ ජනතා විරෝධයන්වල දී, නැවත නැවතත් දැඩිව ඉදිරිපත් කෙරුණු ඉල්ලීමක් වේ.

දැඩි අර්බුදකාරී තත්ත්වයක් මධ්‍යයේ සිටියත්, රටේ පුරවැසියන් තවදුරටත් දුක් විඳිමින් සිටියත්, වගවීම සහ විනිවිදභාවය තහවුරු කරන්නැයි ඔවුන් නැවත නැවතත් ඉල්ලමින් සිටියත්, මේ එකදු හෝ කරුණක් සැළකිල්ලට නොගෙන පරණ පුරුදු ලෙසම කටයුතු කිරීම, රටේ ආර්ථිකය යළි ගොඩනැංවීමේ කටයුතුවල තිරසරභාවය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවය දනවන්නකි.

මෙම ඇගයීම සිදුකිරීමට මූලික ලෙස පාදක කරගෙන ඇත්තේ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පණත ප්‍රකාරව ආණ්ඩුවේ අදාළ අමාතයංශ සහ දෙපාර්තමේන්තුවලට යොමුකළ තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් හරහා ලැබුණු තොරතුරු වේ. විමසුමට ලක්කර ඇති යෝජනා 15 සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු, වගකිව යුතු ආයතන මොනවාද සහ වෙනත් ආනාවරණයන් දැනගැනීමට ( https://publicfinance.lk/sin) පිවිසෙන්න.